## 2026 අප්‍රේල් මස 09 දින වත්තේගම නගර සභා රැස්වීම් ශාලාවේ දී පැවති මහා සභා වාර්තාව

- **සහභාගී වීම**

| | |
|---|---|
| 1. ඩී.එස්. උයන්ගොඩ මැතිතුමා | - ගරු සභාපති |
| 2. ජේ.ඒ.යූ. ගමගේ මැතිතුමා | - ගරු උප සභාපති |
| 3. එච්. ප්‍රියන්ත පුෂ්ප කුමාර මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 4. ඒ.එම්. මොනිකා අබේකෝන් මැතිනිය | - ගරු නගර සභා මන්ත්‍රී |
| 5. ඩී.පී.ඩබ්.ජී අනුර කුමාර මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 6. සී.ඩී. ගුරුගල්ගේ මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 7. බී.ඒ.දුමින්ද පෙරේරා මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 8. ඊ.ජී.ජේ. ආරියවංශ මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 9. ඒ.ජී.ආර්. ගුණවර්ධන මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 10. ආර්.ජී.යූ.සෙතානී රාජමන්ත්‍රී මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 11. ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 12. ඩී.ජී.එස්. විජේසූරිය මැතිනිය | - ගරු නගර සභා මන්ත්‍රී |
| 13. අයි.එම්.එස්.ආර්. රණසිංහ මැතිනිය | - ගරු නගර සභා මන්ත්‍රී |
| 14. ඒ.ජී.කේ. රොෂාන් ජයවීර මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 15. ඩබ්.ටී. රාජමන්ත්‍රී මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 16. ඩබ්.එම්.ඒ.බී. විරකෝන් මැතිතුමා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 17. වී.බී.වස්ගේවත්ත මහතා | - ලේකම් |

- සහභාගී නොවීම - නැත

ගරු සභාපති ඩී.එස්. උයන්ගොඩ මහතාගේ ප්‍රධානත්වයෙන් න්‍යාය පත්‍රයට අනුව සභාවේ කටයුතු පෙ.ව 10. 00 ට ආරම්භ විය.

**(අ) 2026.03.12 දින පසුගිය මහා සභා වාර්තාව ස්ථිර කිරිම.**

2026.03.12 දින පැවති මහා සභා වාර්තාව සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාල වාර්තාවේ (එ).1.8.3 හි ඇති "උඩුරාවන ක්‍රීඩාංනය" යන්න "නුවරතැන්න ක්‍රීඩාංගනය" ලෙස සංශෝධනය විය යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව 2026.03.09 දින පැවති මහා සභා රැස්වීම වාර්තාව ඉහත සඳහන් සංශෝදන වලට යටත්ව සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී යූ.ආර්.එස් රාජමන්ත්‍රී මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ඒ අනුව ඉහත සඳහන් සංශෝධනයට යටත්ව 2026.03.12 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

(ඉ) නගර සභාව අමතා එවන ලද ලිපි ,පෙත්සම් ,පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම

(ඇ) විධිවූ පරිදි කලින් එවා තිබෙන ප්‍රශ්ණ - **නැත**

(ඈ) විධිවූ පිරිධි කලින් එවා තිබෙන යෝජනා

**ගරු සභාපති ඩී.එස් .උයන්ගොඩ මහතාගේ යෝජනා**

1. වත්තේගම නගර සභාවට අයත් දෙල්ගහලන්ද ඉඩමෙන් අක්කර ,02රූඩ ,03පර්චස් 14.92ක ඉඩම් ප්‍රමාණයට අදාල සංශෝධිත පිඹුරුපත් අංක 429අනුමත කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවිය යුතු රු60,159.95 .ක ඇස්තමේන්තුගත මුදල ගෙවීම් අනුමැතිය සඳහා වන ඉල්ලීම මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාවට ඉදිරිපත් කරමි.

1.1.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.1.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹි අතර එම අවස්ථාව කිසිවෙකුත් ලබා නොගන්නා ලදි.

**1.1.3 ඒ අනුව ඉහත සඳහන් දෙල්ගහලන්ද ඉඩමෙන් අක්කර 02, රූඩ 03, පර්චස් 14.92 ක ඉඩමට අදාල පිඹුර අනුමත කරගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවිය යුතු රු.60,159.95ක ඇස්තමේනතුගත මුදල ගෙවීම සුදුසු බව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

2. වත්තේගම නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා හිගව පවතින ඖෂධ ,රෝගීන්ගේ සුභසාධනය සලකා ,පවතින හදිසි අවශ්‍යතාවය මත ,ඉතිරි මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ ආවරණ අනුමැතිය ලබා ගැනීමට යටත්ව මිලදී ගැනීම සුදුසු බවට පරිසර හා සෞඛ්‍ය කාරක සභාවේදී නිර්දේශ වු අතර ඒ සඳහා වන ඉල්ලීම මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ගරු මහා සභාවට ඉදිරිපත් කරමි.

1.2.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී සී. ඩී ගුරුගල්ගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.2.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹි අතර එම අවස්ථාව කිසිවෙකු විසින් ලබා නොගන්නා ලදි.

**1.2.3 ඒ අනුව ඉහත සඳහන් නිදහස් ආයුර්වේද ශාලාව සඳහා හිඟව පවතින ඖෂධ මිලදී ගැනීමේ යෝජනාව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

3. දුංඔය ආදාහනාගාරය සේවා කිරීම සඳහා ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය විසින් යොමු කර ඇති රු 2,537,000.00 .ක ඇස්තමේන්තුව සහිත ලිපිය සම්බන්ධව සාකච්ඡා කර නිර්දේශ ලබා ගැනීම සඳහා වන ඉල්ලීම මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාවට ඉදිරිපත් කරමි.

1.3.1 ඉහත යෝජනාව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.3.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹී අතර එම අවස්ථාවේදී ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා විසින් මෙම අළුත් වැඩියාව සිදු කිරීමෙන් අනතුරුව මෙම ආදාහනාගාරය මඟින් කොපමණ කාලයක සේවාවක් ලබා දීමේ හැකියාව තියෙනවද (වගකීම් කාලය) යන්න හා ඉතාම කෙටි කාලයකින් මෙම අළුත් වැඩියා කටයුත්ත අවසන් කරන ලෙසත් එතුමා විසින් යෝජනාකරන ලදි.

1.3.3 අනතුරුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**1.3.4 ඒ අනුව ඉහත සඳහන් දුංඹය ආදාහනාගාරය සේවා කිරීම සඳහා ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය විසින් ඇස්තමේන්තු කර ඇති රු.2,537,000.00 ක මුදල ගෙවීමේ යෝජනාව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

4. වත්තේගම නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන ආදාහනාගාරය සඳහා භාවිත වන 37.5 Kg ප්‍රමාණයේ ගෑස් සිලින්ඩරයක මිල රු16 649.00,සිට රු 17,149.00 .දක්වා රු 500.00 .කින් මිල ඉහල ගොස් ඇති බැවින් අදාල මිල ගණන් අනුව ආදාහනාගාර ගාස්තුව සම්බන්ධව සාකච්ඡා කර නිර්දේශ ලබා ගැනීම සඳහා වන ඉල්ලීම මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාවට ඉදිරිපත් කරමි.

රුක්මන් උඩුරාවණ,

සංවර්ධන නිලධාරි,

මිලු ආදායම් විෂය

2026.04.08 .

ලේකම්තුමනි,

<u>ගෑස් මිල වැඩිවීම මත ආදාහනාගාර සේවා ගාස්තු වැඩිවීම.</u>

දැනට පවත්නා ගෝලිය අර්බුදය සමඟ සිදුවූ ආර්ථික විපර්යාසය මත ගෑස් මිලෙහි වැඩිවීමක් සිදුව ඇති බැවින් වත්තේගම නගර සභාව මඟින් පවත්වාගෙන යන ආදාහනාගාර සේවා ගාස්තු වැඩිකිරීමට සිදුව ඇත.

37.5 kg ගෑස් සිලින්ඩරයක මිල වැඩිවීම පහත සඳහන් කරමි.

| | |
|---|---|
| ගෑස් සිලින්ඩරයක නව මිල | රු.20,649.00 |
| ගෑස් සිලින්ඩරයක පැවති මිල | රු.16,649.00 |
| වැඩි වී ඇති මුදල | රු. 4,000.00 |

ගෑස් 1 kg ක් සඳහා වැඩි වූ මිල (4000 ÷37.5kg) = රු.106.60

එක් ආදාහනයක් සඳහා වැය වන ගෑස් ප්‍රමාණය = 25kg (ආසන්න)

ඒ අනුව ආදාහනයක් සඳහා වැඩිවූ මුදල = රු.106.60 × 25kg = රු2665.00

ආදාහනයක් සඳහා වැඩිකිරීමට අපේක්ෂිත අයකිරීම = රු. 2500.00

ඒ අනුව ඊට අනුරූපව නගර සභා බල ප්‍රදේශය තුළ එක් ආදාහනයක් සඳහා රු.14000.00 ලෙස පැවති මිල ගණන් තාවකාලිකව රු 2500.00 න් වැඩි කිරීමටත් එය රු.16500.00 ලෙසද නගර සීමාවෙන් පිට ආදාහනයක් සඳහා රු.14500.00 ලෙස පැවති මිළ ගණන් තාවකාලිකව රු.2500.00 කින් ද වැඩිකර එය රු.17000.00 ක් ලෙසත් වැඩිකිරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා කාරුණික ඉදිරිපත් කරමි.

රුක්මන් උඩුරාවණ

සංවර්ධන නිලධාරි,

1.4.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.4.2 ඉන් අනතුරුව විවාද අවස්ථාව එළඹි අතර එම අවස්ථාවේදී ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා විසින් පවසන ලද්දේ මෙය රටේ පවතින අර්බුදයක් හේතුවෙන් පැන නැගී ඇති තාවකාලික ගැටළුවක් වන බැවින් අපි මේ මුදල සභාව මඟින් දරාගැනීම සුදුසු බවට එතුමා විසින් යෝජනා කරන ලදි.

1.4.3 අනතුරුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් පවසන ලද්දේ ආදාහනාගාරය සේවා කිරීමෙන් අනතුරුව මෙම මිල වැඩි කිරීම සුදුසු බවත් එතෙක් නගර සභාව විසින් අලාභය විඳ දරා ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදි.

1.4.4 අනතුරුව ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්.එම් අබේකෝන් මැතිනිය විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

**1.4.5 ඒ අනුව ඉහත සඳහන් දුංඔය ආදාහනාගාරය සේවා කිරීමෙන් අනතුරුව ගාස්තු සංශෝධනය කිරීම සුදුස බවටත්, එතෙක් අලාභය නගර සභාව විසින් දරාගැනීම සුදුසු බවට වන යෝජනව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

5. ජාතික විගණන උප කාර්යාලය මගින් යොමු කර ඇති 2026.03.17 දිනැති විගණන විමසුම සම්බන්ධව සාකච්ඡා කර නිර්දේශ ලබා ගැනීම සදහා වන ඉල්ලීම මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාවට ඉදිරිපත් කරමි.

1.5.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ජී.ඩබ්.ජී අනුර කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.5.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹී අතර එම අවස්ථාවේදී ගරු නගර සභා උප සභාපති විසින් මෙම විගණන විමසුම පිළිබඳව සභාව හමුවේ පැහැදිලි කිරීමක් සිදු කරන ලදි. ඒ අනුව මෙම ඇතැම් ගැටළු ඉතා පැරණි බැවින් පිලිතුරු ලබා දීමේ ගැළුවක් ඇති බැවින් මේ පිළිබඳව පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් පැතීම සුදුසු බවට යෝජනා බවයි.

1.5.3 ඒ අනුව ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා විසින් පවසන ලද්දේ පළාත් පාලන කොමසාරිස් වෙත මෙම ගැටළු යොමුකර ලැබෙන පිළිතුර සලකා බලා ඒ අනුව ජාතික විගණන අධිකාරි වෙත පිළිතුරු යැවීම සුදුසු බවයි.

1.5.4 ඒ අනුව මෙම මහා සභාව ගරු නගර සභා මන්ත්‍රි සී.ඩී ගුරුගල්ගේ මැතිතුමා විසින් කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බවට යෝජනා කල අතර එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ඩී.ජී.ඩබ්.ජී අනුර කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.5.5 එම අවස්තාවේදී ලේකම් වී.බී වස්ගේවත්ත මහතා විසින් පැහැදිලි කිරීමක් සිදු කරන ලදි.

1.5.6 පසුව කාරක සභාව ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.ටී රාජමන්ත්‍රි මැතිතුමා විසින් මහා සභවක් බවට කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඒ.ජී.කේ.ආර් ජයවීර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

1.5.7 අනතුරුව එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.ටී රාජමන්ත්‍රි මැතිතුමා විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

**1.5.8 ඒ අනුව ඉහත සඳහන් ජාතික විගණන උප කාර්යාලයේ 2026.03.17 දිනැති විගණන විමසුමට ලබා දිය යුතු පිළිතුරු පිළිබඳව පලාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් පැතීම සුදුසු බවට සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

6. දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ආපදාවට ලක්වූ දැනට භාවිත කිරීමට නොහැකි තත්ත්වයේ පවතින මාර්ග පිළිසකර කිරීමට අවශ්‍ය ව්‍යුහ සැළසුම් හා ඇස්තමේන්තු ලබා ගැනීම සඳහා ඉංජිනේරුමය කාර්යන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත ලිපි යොමු කිරීමෙන් අනතුරුව ඔවුන් විසින් ලබාදෙන ලද ඇස්තමේන්තුව කර්මාන්ත ,ජල හා විදුලි කාරක සභා නිර්දේශය මත මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ගරු මහා සභාවට ඉදිරිපත් කරමි.

1.6.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ඒ.ජී.ආර් ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.6.2 **ඒ අනුව ඉහත සඳහන් දිට්වා සුළි කුණාටුවෙන් ආපදාවට ලක් වූ දැනට භාවිතයට ගත නොහැකි මාර්ග පිළිසකර කිරීමට අවශ්‍ය ව්‍යුහ සැලසුම් හා ඇස්තමේන්තු සැකසීමට ඉංජිනේරුමය කාර්යන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත යොමු කළ බව ගරු මහා සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.**

7. වත්තේගම නගර සභාව සඳහා භාණ්ඩ හා සේවා සපයා ගැනිම සම්බන්ධ සැපයුම්කරුවන් ලෙස 2026වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ලියාපදිංචි කරන ලද සැපයුම්කරුවන්ගේ ලේඛණය භාවිත කිරීමට තීරණය කල බැවින් 2026 වර්ෂය සඳහා එම ලේඛණය ලබා ගන්නා ලදි .නමුත් එම ලේඛණය අනුව භාණ්ඩ හා සේවා සපයා ගැනීමේදී ගැටලු පැණනැගී ඇති බැවින් හා වත්තේගම නගර සභාව විසින් දැනටමත් භාණ්ඩ ලබාගන්නා සැපයුම්කරුවන් 08දෙනකු එම ලේඛණයේ ඇතුලත් වී නොමැති බැවින් 2026 ,වර්ෂයේ ඉදිරි කාලසීමාව සඳහා අදාල ප්‍රාදේශීය සැපයුම්කරුවන් 08දෙනා සැපයුම්කරුවන් ලෙස ලේඛණගත කිරීමට හා ඉදිරි කාලසීමාව සඳහා භාණ්ඩ හා සේවා සපයා ගැනීම සම්බන්ධයෙන් ක්‍රියා කළයුතු ආකාරය පිළිබද ,උපදෙස් ලබා ගැනීම සඳහා වන ඉල්ලීම මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාවට ඉදිරිපත් කරමි.

1.7.1 ඉහත යෝජනාව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.7.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹි අතර එම අවස්ථාවේදී ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් පවසන ලද්දේ මෙලෙස සමිතියක් මඟින් සංවර්ධන ව්‍යාපෘති ඉටු කර ගැනීමේ ක්‍රමය ප්‍රායෝගිකව අසාර්ථක බැවින් ඍජුවම කොන්ත්‍රාත් කරුවන් සඳහා භාරදීම සුදුසු බවට යෝජනා කරන ලදි.

1.7.3 ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී.එන්.විජේනායක මැතිතුමා විසින් පවසන ලද්දේ මෙම කාරනය පිළිබඳව අපිට තීරණයක් ගත නොහැකි බවත්, ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන්ගේ ලේඛණයේ Sleeda සහතිකය ලත් සුදුසුකම් සම්පූර්ණ කරන ලද සැපයුම්කරුවන් ලියාපදිංචි වී ඇති බවත්ය. එමෙන්ම මේ ගැටළුව සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්ගෙ උපස් ලබා කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදි.

1.7.4 අනතුරුව වැඩිදුරටත් මේ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ගරු නගර සභා මන්ත්‍රී බි.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීමට යෝජනා කළ අතර එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ජී.එස්. විජේසූරිය මැතිනිය විසින් ස්ථිර කරන ලදි.

1.7.5 කාරක සභා අවස්ථාවේදී ලේකම් වී.බී වස්ගේවත්ත මහතා හා වැඩ අධිකාරී එස්.එම්.ඊ.සී.බී සමරකෝන් මහතා විසින් කරුණු පැහැදිලිකිරීමක් කරන ලදි.

1.7.6 පසුව ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්.එම් අබේකෝන් මැතිනිය විසින් කාරක සභාව මහා සභාවක් කිරීමට යෝජනා කළ අතර එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී සී.ඩී ගුරුගල්ගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.6.3 වත්තේගම නගර සභාව සඳහා භාණ්ඩ හා සේවා සපයා ගැනීම සම්බන්ධ සැපයුම්කරුවන් පත් කර ගැනීම සඳහා පුවත් පත් දැන්වීමක් හා කාර්යාලීය වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කිරීම සුදුසු බවට ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් යෝජනා කරන ලදි

**1.5.9 ඒ අනුව ඉහත සඳහන් වත්තේගම නගර සාභාව සඳහා භාණ්ඩ හා සේවා සපයා ගැනිම සම්බන්ධයෙන් සැපයුම්කරුවන් පත් කර ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් හා කාර්යාලීය වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කිරීම සුදුසු බවට සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි**

8. වත්තේගම නගර සභාවට අයත් පාරවල් වල පස් ඉවත් කිරීමේ කටයුතු සඳහා එස්කැවේටර් යන්ත්‍රයක් වැඩ කරන පැයකට රු 3,500.00 .ක මුදලක් අයකර කුලියට ලබාදිය හැකි බවත් ඉදිරියේදී ඩීසල් මිලෙහි සිදුවන සංශෝධනයන්ට අනුව මෙම මිල ගණන් සංශෝධය විය හැකි බවත් සඳහන් කරමින් 2026.03. 23 වන දින අංක ,1/252මීගම්මන වත්ත ,වත්තේගම යන ලිපිනයෙහි පදිංචි තාරක දහම්පත් කුඹුරගේ මහතා විසින් යොමු කර ඇති ලිපිය මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාවට ඉදිරිපත් කරමි.

1.8.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.8.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹි අතර එම අවස්ථාව කිසිවෙකුත් ලබා නොගන්නා ලදි.

1.8.3 **ඒ අනුව ඉහත සඳහන් වත්තේගම නගර සභාවට අයත් පාරවල් වල පස් ඉවත් කිරීමට තාරක දහම්පත් කුඹුරගේ මහතාගේ එස්කැවේටර් යන්ත්‍රය යොදා ගන්නා බව ගරු මහා සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.**

9. වත්තේගම නගර සභාවට අයත් නගර සභා ගොඩනැගිල්ල පිහිටි ඉඩම ,පුංචිමෝල ජල මූලාශ්‍රය වෙනුවෙන් මෙහෙණි ආරාමය විසින් පරිත්‍යාග කළ ඉඩම් කොටස හා ළමා පුසුතකාලය පිහිටි ඉඩම යන ඉඩම් මැන සලකුණු කර නව පිඹුරුපත් සකස් කිරීම සඳහා වන ඉල්ලීම මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය මත ගරු මහා සභාවට ඉදිරිපත් කරමි.

1.9.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ජී.එස්. විජේසූරිය මැතිනිය විසින් ස්ථිර කරන ලදි.

1.9.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹි අතර එම අවස්ථාව කිසිවෙකුත් ලබා නොගන්නා ලදි.

**1.9.3 ඒ අනුව ඉහත සඳහන් නගර සභා ගොඩනැගිල්ල, පුංචිමෝල ජල මූලාශ්‍රය වෙනුවෙන් මෙහෙනි ආරාමය විසින් පරිත්‍යාග කළ ඉඩම හා ළමා පුස්තකාලය පිහිටි ඉඩම මැන නව පිඹුරුපතක් සකස් කිරීම සුදුසු බව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

10. 2026.03.25වන දින සිදු කරන ලද මහනුවර මහ නගර සභාවට අයත් ගොහාගොඩ කසල අංගනය නිරීක්ෂණ චාරිකාවේ වාර්තාව සම්බන්ධව සාකච්ඡා කර නිර්දේශ ලබා ගැනීම සඳහා වන ඉල්ලීම මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අප නගර සභාවට අයත් මියන්පහේවත්ත කසල අංගනය කඩිනමින් නිරීක්ෂණය කර ,අප නගර සභාව විසින් කසල ආශ්‍රීතව කුමන නිෂ්පාදනයක් සිදු කිරීම වෙත යොමුවන්නේද යන්න තීරණය කිරීම සඳහා රැස්වීමක් කැඳවීම සුදුසු බවටත් ,Design and Build ක්‍රමය අනුව කසල අංගනයේ ඉදිරි සංවර්ධන කටයුතු සිදු කිරීම සුදුසු බවටත් වූ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය ගරු මහා සභාවට ඉදිරිපත් කරමි.

1.10.1 ඉහත යෝජනාව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.10.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹි අතර එම අවස්ථාව කිසිවෙකුත් ලබා නොගන්නා ලදි.

1.10.3 **ඒ අනුව ඉහත සඳහන් Design and build ක්‍රමය අනුව මියන්පාහේවත්ත කසල අංගනයේ ඉදිරි සංවර්ධන කටයුතු සිදු කිරීමට කටයුතු යොදා ඇති බව ගරු මහා සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

11. 2026 වර්ෂයේ සිංහල හා හින්දු අලුත් අවුරුදු සමය වෙනුවෙන් අවුරුදු පොළ සඳහා මෙවර විශාල අයදුම්කරුවන් ප්‍රමාණයක් ඉදිරිපත් වී තිබූ බැවින් වෙළදකුටි වෙන්කර දීම සම්බන්ධව කටයුතු කල යුතු ආකාරය පිළිබද උපදෙස් ලබා ගැනීම සඳහා වන ඉල්ලීම මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර වත්තේගම නුවර පාරේ නගර සභා ගොඩනැගිල්ල අසල සිට මාතලේ පාර හංදිය දක්වා වෙළද කුටි 17ක් හා වානිවිලාස් ඉදිරිපිට වෙළද කුටි 4ක් සඳහා ඉදිරිපත් වී ඇති අයදුම්කරුවන් වෙත කුසපත් ඇදීම මගින් වෙළදකුටි වෙන්කර දීම සුදුසු බවට වූ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය ගරු මහා සභාවට ඉදිරිපත් කරමි.

1.11.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.ආර්. ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

1.11.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹී අතර එම අවස්ථාවේදී ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී.එන්.විජේනායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලද්දේ ලබන වසරේදී කුසපත් ඇදලා කඩ කාමරය මිලදී ගන්නා අවස්ථාවේදීම මුළු මුදලම අය කර ගැනීමට කටයුතු කරන ලෙස යෝජනා කරන ලදී.

1.11.3 ඒ අනුව ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලද්දේ මෙම කටයුත්ත අපිට ලබන වසරේ සිදු කිරීමේ හැකියාවක් නොමැති බවත්, මේ සඳහා වත්තේගම පොලිස් ස්ථානාධිපතිතුමාගේ විරෝධය දක්වා ඇති බවත්ය.

1.11.4 එමෙන්ම ගරු උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලද්දේ පන්විල මාර්ගයේ ගොඩනැගිලි දෙකක් අතර ඇස් හිස් භූමි කොටස ලබන වසරේ කොන්ක්‍රීට් කර ව්‍යාපාරික ස්ථානයක් බවට පත් කිරීමට යෝජනා කරන ලදී.

1.11.5 ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී.එන්.විජේනායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලද්දේ මෙම යෝජනාව ඉතා හොද යෝජනාවක් බවත්

**1.11.6 ගරු මහා සභාවේ දැනගැනීම පිනිස ඉදිරිපත් කරන ලදී**

2. **<u>ගරු උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා</u>**

1.2026සභා අරමුදලින් සිදු කරන සංවර්ධන යෝජනා සංශෝධනය කිරීම.

2026 සභා අරමුදලින් සිදු කරන සංවර්ධන යෝජනා සංශෝධනය කිරිම සම්බන්ධවයි.

උක්ත කරුණට අදාළව පහත සදහන් සංවර්ධන යෝජනා දෙක 2026.01.16 දින පැවති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී අනුමත වූ අතර ඒ සදහා KDS/PDB/3/11/1-3 හා 2026.01.26 දිනැති ලිපිය මගින් අනුමැතිය ලැබී ඇත. (ලිපියේ පිටපතක් අමුණා ඇත.)

2. නමුත් මෙම ව්‍යාපෘති දෙක සදහා වෙනත් අරමුදල් මූලාශ්‍ර මගින් මේ වන විට ප්‍රතිපාදන වෙන් වී ඇති බව මෙම යෝජනා ලබා දුන් ගරු නාගරික මන්ත්‍රීවරුන් විසින් දන්වා ඇති අතර ඒ අනුව එම යෝජනා දෙක පහත පරිදි සංශෝධනය කර දෙන මෙන් ඉල්ලීම් කොට ඇත.

| අනු අංකය | අරමුදල් මූලාශ්‍රය | ව්‍යාපෘතිය | ප්‍රතිපාදන මුදල | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|---|---|
| 1. | සභා අරමුදල් | ගලදෙණිය - බංඩාර බාස්උන්නැහේගේ වෙළදසැල ඉදිරිපිට අත්කම්නිවාස වලට යන පඩිපෙල ප්‍රතිසංස්කරණය කිරිම | ලක්ෂ 4 | දෙල්ගහලන්ද සිට කමත පාර හරහා නගරයට පැමිණීමට හැකි වන අයුරින් සේන මහතාගේ නිවස අසලින් ඇති කොටස සංවර්ධනය කිරිම |
| 2. | සභා අරමුදල් | උඩුරාවණ - ගිරාදෙණිය පාර බෝක්කුව හා ඉතිරි කොටස සෑදීම | ලක්ෂ 3.5 | පාසල් පටුමග ආරක්ෂිත ප්‍රවේශ බැම්ම හා මාර්ගය සංවර්ධනය කිරීම |

ඒ අනුව ඉහත යෝජනා දෙක සංශෝධනය සදහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට යොමු කර ඇත.

2.1.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී සී.ඩී ගුරුගල්ගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

2.1.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹි අතර එහිදී ගරු නගර සභා මන්ත්‍රි ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා විසින් විමසන ලද්දේ මෙලෙස සංශෝධනය කිරීමට හේතුව කුමක්ද ලෙසයි?

2.1.3 ඒ අනුව ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා විසන් පවසන ලද්දේ මෙම ව්‍යාපෘති දෙක සඳහාම වෙනත් මූලාශ්‍ර මඟින් මුදල් ලැබෙන බැවින් මෙලෙස සංශෝදනය කර ඇති බවයි.

2.1.4 ඒ අනුව ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

2.1.5 **ඒ අනුව ඉහත සඳහන් 2026 වර්ෂයේ සභා අරමුදලින් සිදු කරන සංවර්ධන යෝජනා සංශෝධන කිරීම සුදුසු බව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

## 03. ගරු නගර සභා මන්ත්‍රි බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා

1. නගරය පිරිසිදු කරන කණ්ඩායමේ 13දෙනෙකු සිටියද සෑම දිනකම සේවයට වාර්තා කරන්නේ ඉතා අඩු පිරිසක් වන බැවින්කට පෙර ඒ බව 02 නිවාඩු ලබා ගැනීමට දින , .දැනුවත් කර ඊට සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා මෙන් යෝජනා කරමි

3.1.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි සී.ඩී ගුරුගල්ගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

3.1.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹී අතර එම අවස්ථාව කිසිවෙකුත් ලබා නොගන්නා ලදි.

3.1.3 **ඒ අනුව ඉහත සඳහන් නගරය පිරිසිදු කරන කණ්ඩායමේ 13 දෙනාගේ නිවාඩු ලබා ගැනීමේදී සුදුසු ක්‍රියා මාර්ගයන් අනුගමනය කිරීම සුදුසු බව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

2. මියන්පාහේ වත්ත නගර සභා නිවාස වල සභා සේවකයන් ක් පමණ ජීවත් වන අතර 05 ඒ අනුව .හිම වෙනත් ස්ථාන වල සේවයේ යෙදෙන පුද්ගලයන් ජීවත් වේ06 ඉතිරි නිවාස එම නිවෙස් වල ජීවත් වන පවුල් වල එක් සාමාජිකයකු හෝ වත්තේගම නගර සභාවේ කටයුතු සඳහා යොදවා ගැනීමට කටයුතු කළ යුතු වන අතර එසේ නොවන්නේනම් එම නිවාස වලින් ඉවත් කිරීමට කටයුතු කරන ලෙස යෝජනා කරමි.

3.2.1 ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී සී.ඩී ගුරුගල්ගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

3.2.2 ඉන් අනතුරුව විවාද අවස්තාව එළඹී අතර එම අවස්ථාව කිසිවෙකුත් ලබා නොගන්නා ලදි.

3.2.3 **ඒ අනුව ඉහත සඳහන් මියන්පාහේ වත්තේ ජීවත්වන සේවකයන් පිළිබඳව තීරණයක් ගැනීම සුදුසු බව සියළුම සභිකයින් ඒකමතිකව සම්මත කරන ලදි.**

(ඔ) සෙසු කරුණු

1. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

# මියන්පහේවත්ත කසළ අංගනය ප්‍රතිසංස්කරණය සහ ඒකාබද්ධ කොම්පෝස්ට් නිෂ්පාදනාගාරයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ විශේෂ සාකච්ඡා වාර්තාව

දිනය: 2026 අප්‍රේල් මස 06වන දින
වේලාව: ප.ව. 10.30 ට
ස්ථානය: වත්තේගම නගර සභා රැස්වීම් ශාලාව
මූලාසනය: ගරු සභාපති ඩී.එස්. උයන්ගොඩ මහතා

---

**පැමිණ සිටි පිරිස:**

01. ඩී.එස්. උයන්ගොඩ මයා - ගරු සභාපති
02. ජේ.ඒ.ශූ. ගමගේ මයා - ගරු උප සභාපති
03. ප්‍රියන්ත පුෂ්පකුමාර මයා - ගරු නගර සභා මන්ත්‍රී
04. සී.ඒ. දුමින්ද පෙරේරා මයා - ගරු නගර සභා මන්ත්‍රී
05. ඊ.ජී. ජයතිලක ආරියවංශ මයා - ගරු නගර සභා මන්ත්‍රී
06. උදය රාජමන්ත්‍රී මයා - ගරු නගර සභා මන්ත්‍රී
07. ඩී.බී. වස්ගේවත්ත මයා - ලේකම්
08. ඒ. සමරකෝන් මයා - වැඩ අධිකාරී
09. අනුෂා නානායක්කාර මිය - පරිසර හා සෞඛ්‍ය විෂයභාර නිලධාරී

---

**01) මූල්‍ය කළමනාකරණය සහ භූමි සැලසුම්කරණය (Financial Management & Site Planning):**

වෙන් කර ඇති රුපියල් මිලියන 25.66 ක ප්‍රතිපාදන උපරිම ඵලදායිතාවයකින් යුතුව යෙදවීම පිළිබඳව ලේකම්තුමා විසින් කරුණු පැහැදිලි කරන ලදී. ඒ අනුව පහත තීරණවලට එළඹෙන ලදී:

- **භූමිය සකස් කිරීම:** විධිමත් භූමි අලංකරණ (Landscaping) සැලැස්මකට අනුව භූමිය මට්ටම් කර සකස් කරගත යුතු බවත්, තාක්ෂණික උපදෙස් මත ප්‍රමිතියෙන් යුතු ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කළ යුතු බවත් තීරණය විය.
- **අංගන ප්ලෑන් (Yard Layout):** කසළ අංගනය තුළ මෙහෙයුම් කටයුතු පහසු වන පරිදි විධිමත් සැලසුමක් (Layout/Plat) සකස් කර ගැනීමට යෝජනා විය.

**02) සේවක නිවාස ගැටලුව සහ භූමිය පරිහරණය:**

දැනට කසළ අංගන භූමිය තුළ පදිංචිව සිටින සෞඛ්‍ය කම්කරුවන්ගේ නිවාස පවතින ස්ථාන ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සඳහා අත්‍යවශ්‍ය වන බව ලේකම්තුමා පෙන්වා දුන්නේය.

- **නිවාස ප්‍රතිස්ථාපනය:** දැනට සිටින පදිංචිකරුවන් ඉවත් කළ නොහැකි බැවින්, ඔවුන් වෙනුවෙන් සුදුසු පදිංචි ස්ථානයක් කසළ අංගනයේ කොළවරක සකස් කර දී, දැනට ඔවුන් පදිංචි ස්ථාන ව්‍යාපෘති අවශ්‍යතා සඳහා නිදහස් කර ගැනීමට තීරණය විය.
- **ශ්‍රම දායකත්වය:** දැනට එහි පදිංචි පිරිසෙන් පස් දෙනෙකු (05) පමණක් සභාවේ ස්ථිර සේවයේ නියුතු බැවින්, නව කොම්පෝස්ට් අංගනය ආරම්භ කිරීමත් සමඟ ඉතිරි නිවාස හිමිකරුවන්ගේ ශ්‍රම දායකත්වය ද මෙම ව්‍යාපෘතියේ සේවය සඳහා ලබා ගැනීමට ගරු දුමින්ද පෙරේරා මන්ත්‍රීතුමා යෝජනා කරන ලදී.

**03) සැලසුම් සහ ඉදිකිරීම් සංකල්පය (Design & Build):**

මෙම ව්‍යාපෘතියේ පවතින තාක්ෂණික සංකීර්ණත්වය සලකා බලා, එය **"Design & Build"** (සැලසුම් කර ඉදිකිරීම) යන සංකල්පය යටතේ බාහිර විශේෂඥ ආයතනයක සහාය ඇතිව සිදු කිරීම වඩාත් උචිත බවට ගරු උපසභාපතිතුමා ඉදිරිපත් කළ යෝජනාවට එකඟතාවය පළ විය.

**04) යන්ත්‍රෝපකරණ සහ ගබඩා පහසුකම්:**

ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් අංශයන් ස්ථාපිත කිරීමට යෝජනා විය:

- කොම්පෝස්ට් නිපදවීමේ අංශය.
- ප්ලාස්ටික් කැට (Plastic Granules) සැකසීමේ යන්ත්‍ර ස්ථාපිත කිරීම සඳහා වන විශේෂිත අංශය.
- බෙල් කරන ලද (Baled) පොලිතින් ආරක්ෂිතව රඳවා තබා ගැනීම සඳහා ගබඩා පහසුකම් සකස් කිරීම.

**05) සැලසුම් සහ ඉදිකිරීම් සංකල්පය (Design & Build) සහ ප්‍රසම්පාදනය:**

ව්‍යාපෘතියේ ඇති තාක්ෂණික සංකීර්ණත්වය සලකා බලා, එය **"Design & Build"** (සැලසුම් කර ඉදිකිරීම) යන සංකල්පය යටතේ සිදු කිරීම වඩාත් උචිත බවට ගරු උපසභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

- **තාක්ෂණික නිර්දේශ:** ඒ අනුව, පරිසර අමාත්‍යාංශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංශයේ ප්‍රධාන ඉංජිනේරුතුමාගේ තාක්ෂණික නිර්දේශයන්ට යටත්ව, **"Design & Build"** පදනම මත ටෙන්ඩර් කැඳවා (Tendering) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යොජනා කරන ලදී.

02.

"ඉතා ක්‍රියාකාරකම් තුළින් මහනුවර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන දියුණු කිරීමට"


**පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය**

පළාත් සභා සංකීර්ණය (කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනය) ආයුර්වේද පාර, පල්ලේකැලේ, කුණ්ඩසාලේ.

**உள்ளூராட்சி உதவி ஆணையாளர் அலுவலகம்**

மாகாண சபைக் கட்டிடத் தொகுதி (முகாமைத்துவ அபிவிருத்திப் பயிற்சி நிறுவகம்) ஆயுர்வேத மாவத்தை, பல்லேகலை, குண்டசாலை.

**OFFICE OF THE LOCAL GOVERNMENT ASSISTANT COMMISSIONER**

Provincial Council Complex, (Management Development Training Unit) Ayurweda Road, Pallekele, Kundasale.

කාර්යාලය / அலுவலகம் / Office } 081-2213362
ෆැක්ස් / தொலை நகல் / Fax } 081 -2213362
විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail } aclgkandy@yahoo.com


මගේ අංකය / எனது இல. / My No. } CPC/ACLG/K/ AM/10/01/09
ඔබේ අංකය / உமது இல. / Your No. } 336
දිනය / திகதி / Date } 2026.03. 27

06 APR 2026
1071
වත්තේගම

ගරු සභාපතිතුමා මගින්,
ලේකම්,
වත්තේගම නගර සභාව,

ගරු සභාපතිතුමනි,

**<u>2025.01.13 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.</u>**

2026 වර්ෂයේ ජනවාරි මස 13 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාවට අදාලව විමර්ශන නිලධාරිගේ වාර්තාව හා බැදේ.

02.ඒ අනුව නිරීක්ෂණය වූ පහත කරුණු ඔබගේ අවධානයට කාරුණිකව ඉදිරිපත් කරමි.

I. පසු ගිය මහා සභා වාර්තාව ස්ථිර කිරීමේදි ඒ සදහා එකගතාවය විමසීම අවශ්‍ය නොවන අතර වාර්තාවේ සංශෝධන ඉදිරිපත් කිරිම හා වාර්තාව ස්ථිර කිරිම පමණක් සිදු කළ යුතු බව
II. (එ)5 යටතේ පාලන වාර්තාව ඉදිරිපත් කර ඇත. එය යෝජනාවක් ලෙස ඉදිරිපත්ව නැත. එබැවින් එය දැනගැනීම සදහා ඉදිරිපත් කරයි නම් සෙසු කරුණු යටතේ දැක්විය හැකි බව
III. මහා සභාවේදි දූරකථනය මගින් තොරතුරු විමසා ඉදිරිපත් කිරිම උචිත නොවන බව
IV. යෝජනා ඉදිරිපත් කළ යුත්තේ යෝජනා ස්වරූපයෙන් බවත් 12. a, b ,c යෝජනා ස්වරූපයෙන් ඉදරිපත් කර නොමැති බව
V. 12 c යෝජනාව ස්ථිර කිරිම දෙවතාවක් සිදුව ඇති බවත් 02,04 යෝජනාවෙහි යෝජනා 2ක් එකවර ඉදිරිපත් කර ඇති බව
VI. සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ විෂය පථයට අදාල කටයුතු වල යෙදවීමට වග බලා ගත යුතු බව
VII. සේවියේ යෙදවීමේදි අධීක්ෂණ ක්‍රියාවලියක් පවත්වා ගත යුතු බව
VIII. විගණන විමසුම් මහා සභාවට ඉදිරිපත් කර සාකච්ජා කළ යුතු බව

03.ඉහත නිරීක්ෂණ කෙරෙහි අවධානය යොමු කර ඉදිරියේදි කටයුතු කිරිම සුදුසු බව කාරුණිකව පෙන්වා දෙමි.

ඒ.ඩබ්.ජී.එල් අත්තනායක ,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
මහනුවර.
පිටපත - 01. පළාත් පාලන කොමසාරිස්, මධ්‍යම පළාත - කා.දැ.ස
02. ලේකම් , වත්තේගම නගර සභාව - අ.ක.ස

අපි ඔබට අත්වැලක් වන්නෙමු — நாம் உங்களுக்கு உதவும் கரமாவோம்

| | | | |
|---|---|---|---|
| පළාත් පාලන අමාත්‍යාංශය, පල්ලේකැලේ<br>உள்ளூராட்சி அமைச்சகம் - பல்லேகலே | : 081 - 4481322 | පළාත් පාලන දෙපාර්තමේන්තුව, පල්ලේකැලේ<br>உள்ளூராட்சி திணைக்களம் - பல்லேகலே | : 081 - 2202262 |
| පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, මාතලේ<br>உள்ளூராட்சி உதவி ஆணையாளர் - மாத்தளை | : 066 - 2233711 | පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, නුවරඑළිය<br>உள்ளூராட்சி உதவி ஆணையாளர் - நுவரெலியா | : 052 - 2222791 |
| පළාත් පාලන පුහුණු මධ්‍යස්ථානය - නවයාලතැන්න<br>உள்ளூராட்சி பயிற்சி மத்திய நிலையம் - நவயாலதென்ன | : 081 - 2497252 | | |

03.

මධ්‍යම පළාත් කෘෂිකර්ම, සුළු වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, ගොවිජන සංවර්ධන, මිරිදිය ධීවර, පරිසර කටයුතු, හින්දු සංස්කෘතික සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය
மத்திய மாகாண விவசாய, சிறு நீர்ப்பாசன, விலங்கு உற்பத்தி மற்றும் அபிவிருத்தி, கமநல அபிவிருத்தி, நன்னீர் மீன்பிடி, சுற்றாடல் விவகாரம், இந்து கலாசாரம் மற்றும் தோட்ட உட்கட்டமைப்பு வசதிகள் அமைச்சு
Ministry of Agriculture, Minor Irrigation, Animal Production and Development, Agrarian Development, Inland Fisheries, Environmental Affairs, Hindu Cultural and Estate Infrastructure Facilities
Central Provincial Council

මගේ අංකය / எனது இல. / My No. CPC /MA/4/6/5/Env./Comm./2026
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2026.04.06

344
08 APR 2026
1092

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
පේරාදෙණිය.

**වත්තේගම නගර සභා ආදාහනාගාර පරිශ්‍රය අලංකාර කිරිම සදහා පේරාදෙණිය උද්භිද උද්‍යානයේ තාක්ෂණික සහාය ලබා ගැනිම**

උක්ත කරුණ සම්බන්ධයෙන් වත්තේගම නගර සභාවේ ගරු සභාපතිතුමන්ගේ 2026.03.19 දින මා ඇමතූ ලිපිය සම්බන්ධයෙනි.

02. ඒ අනුව වත්තේගම නගර සභා ආදාහනාගාර පරිශ්‍රය අලංකාර කිරිම සදහා පේරාදෙණිය උද්භිද උද්‍යානයේ තාක්ෂණික සහාය ලබා ගැනිම සදහා මෙම අමාත්‍යාංශයෙන් ඉල්ලිමක් ඉදිරිපත් කර ඇත. (ලිපියේ පිටපත අමුණා ඇත.) එසේම මෙම අමාත්‍යාංශයේ පරිසර අංශය මගින් කරන ලද සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදි අලංකාරවත්ව හා පරිසර හිතකාමි ලෙස ප්‍රජාවට ප්‍රයෝජනවත් අයුරින් වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සදහා ඔබ හා ඔබ දෙපාර්තමේන්තුවේ නිලධාරින් ලබා දුන් තාක්ෂණික සහයෝගය කෘතඥතා පූර්වකව සිහිපත් කරන අතර , උක්ත සදහන් සංවර්ධන කාර්යය සදහාද ඔබ දෙපාර්තමේන්තුවේ සේවය කරන කෘෂිකර්ම උපදේශක චමින්ද රත්නායක මහතා ගේ සේවය වත්තේගම නගර සභාවට ලබා දිමට අවශ්‍ය කටයුතු කර දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

03. මෙ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ඩබ්.එම්.චමින්ද අබේරත්න ,
සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)
පරිසර අංශය,
0718470923

අ/කලේ-චන්දන වික්‍රමසූරිය,
ලේකම්,
කෘෂිකර්ම අමාත්‍යාංශය,

පිටපත:-

01. ගරු සභාපතිතුමා ,වත්තේගම ප්‍රාදේශීය සභාව,වත්තේගම - කා.දැ.ස.
02. සහකාර අධ්‍යක්ෂ,මල්වගා හා උද්‍යාන අලංකරණ පාසල - කා.දැ.ස.

ගරු අමාත්‍යතුමා / Hon. Minister / கௌரவ அமைச்சர் 081-2386208 ෆැක්ස් Fax 081-2386367
ලේකම් / Secretary / செயலாளர் 081-2386084
විද්‍යුත් තැපෑල / E-mail : agriculturecentral@gmail.com
වෙබ් අඩවිය / www.agrimin.cp.gov.lk
ප්‍රධාන ගණකාධිකාරී / Chief Accountant / பிரதான கணக்காளர் 081-2385243
කාර්යාලය / Office / அலுவலகம் 081-2388336 ෆැක්ස් / Fax 081-2388336
"සමෘද්ධිමත් මැදරටක්"
"சுபீட்சமான மலைநாடு"
අංක 1060, ගැටඹේ, පේරාදෙණිය. இல. 1060, கெட்டம்பே, பேராதெனிய.
No. 1060, Gatambe, Peradeniya.

2. කාරක සභා වාර්තා සලකා බැලීම
   I. 2026.04.21 දින පැවති නිවාස හා ප්‍රජා පහසුකම් කාරක සභාවේ වාර්තාව.
   II. 2026.04.21 දින පැවති පරිසර හා සෞඛ්‍ය කාරක සභාවේ වාර්තාව.
   III. 2026.04.22 දින පැවති කර්මාන්ත.ජල හා විදුලි කාරක සභාවේ වාර්තාව ,
   IV. 2026.04.28 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ වාර්තාව.

3. මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අවසරය - නැත

4. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්.
   1. ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා

ගරු සභාපතිතුමනි මම දැනගන්න කැමති පවතින කාලගුණික තත්ත්වය හමුවේ නළ ළිං භාවිතා කිරීමේ හැකියාවක් පවතීද ගන්න?

එමෙන්ම මම නැවත වරක් යෝජනා කරනවා සභා කටයුතු පිළිබඳව වැඩමුළුවක් ඉතා කඩිනමින් සංවිධානය කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

02. ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්.එම් අබේකෝන් මැතිනිය

ගරු සභාපතිතුමනි රවන් ඔයට යන පඩිපෙල කඩිනමින් පිළිසකර ගර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් මා ඉල්ලා සිටිනවා.

03. ගරු නගර සභා මන්ත්‍රී ඊ.ජී.ජේ. ආරියවංශ මැතිතුමා

ගරු සභාපතිතුමනි යටිරාවන මාර්ගය අසල කම්බිදැල යොදා කඩිනමින් පිළිසකර කරලා දෙන මෙන් ඉල්ලා සිටිනවා.
මේ සඳහා අමුද්‍රව්‍ය ගෙනැවිත් ඇති බවත්, කඩිනමින් අදාල කාර්ය ඉටු කරන බවත් ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා විසින් පවසන ලදි.

04. ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.ඒ.බී. විරකෝන් මැතිතුමා

ගරු සභාපතිතුමනි කොට්ඨාශ 09යේ හැම පාරකම කාණු වැහිලා තියෙන්නේ, ඒ නිසා සතියකට එක කොට්ඨාශය ගානේ පවිත්‍ර කිරීමට මම යෝජනා කරනවා.

05. ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.ආර්. ගුණවර්ධන මැතිතුමා

ගරු සභාපතිතුමනි නගර සභාවේ දැනට තියෙන තණකොළ කපන යන්ත්‍රෙය් අධික ලෙස ඉන්දන දහනයක් වෙනවා. ඒ අනුව මෙම යන්ත්‍රය විකිනීම සුදුසු බවට මම යෝජනා කරනවා, නැත්තන් මේ සඳහා ඉන්දන එකවර ලබාදීමක් සිදු කරන මෙන් ඉල්ලා සිටිනවා.

06. ගරු නගර සභා මන්ත්‍රී ඩී.ජී.එස්. විජේසූරිය මැතිනිය

ගරු සභාපතිතුමනි බස්නැවතුම් පොලේ තැන තැන කුණු දමා තියෙනවා. ඒ වගේම බුලත් කෙල හැමතැනම දාලා තියෙනවා.

බස්නැවතුම්පොල මගී ප්‍රවාහන අධිකාරිය සතු වන අතර මේ පිළිබඳව කිහිප විටක් අපි එතන භාරව සිටින ස්ථානාධිපති දැනුවත් කර ඇති බව ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි

07.ගරු උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා
ගරු සභාපතිතුමනි මම කියන්න කැමතී අපේ වෙබ් අඩවියේ තොරතුරු යාවත්කාලීන කිරීමක් සිදු වෙන්නේ නෑ.

ඒ වගේම අපේ ප්‍රමාණවත් සේවක පිරිසක් නැති නිසා ජල ගැටළුවක් පැන නැගී තියෙනවා.ඒ අනුව සේවකයන් බඳවා ගැනීමක් කළ නොහැකිනම් කොන්ත්‍රාත් පදනමට හෝ සේවක බඳවා ගැනීමක් සිදුකරන මෙන් මා යෝජනා කරනවා.

ඒ වගේම සිංහල දෙමළ නව වසර සඳහා මාගේ සුභාශිංෂණ එක් කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

08. ගරු නගර සභ මන්ත්‍රි බී.ඒ.ඩී පෙරේරා මැතිතුමා.
ගරු සභාපතිතුමනි සති පොල ඉතා සාර්ථකව පවත්වාගෙන යනවා. ඒ අනුව අවරුදු කාලය හේතුවෙන් 9-12 වන දා දක්වා සතිපොල පැවැත්වීමට කටයුතු කරලා තියෙනවා.

ගරු නගර සභා මන්ත්‍රි ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලද්දේ ඉරිදා පොල පැවැත්වීම ඉතාම හොඳයි ඒ වගේම සාර්තකයි, නමුත් සතිය පුරා පොළ පැවැත්වීමට පෞද්ගලිකව මම විරුද්ධයි. මොකද අවරුදු මාසේ මේ අකාරයට පොල දිගින් දිගටම පැවැත්වීමෙන් විශාල ව්‍යාපාර සඳහා ලොකු හානියක් සිදු වෙනවා. මොකද මේ මාසේ තමා එයාල ව්‍යාපාරයක් කරලා ආදායම් උපයා ගන්නේ ඒකට පොල පැවැත්වීමෙන් හානියක් සිදු වෙනවා. ඒ නිසා පෞද්ගලිකව මම විරුද්ධයි.

09. ගරු නගර සභා මන්ත්‍රි ඒ.එම්.එම් අබේකෝන් මැතිනිය
ගරු සභාපතිතුමනි පොල දිගින් දිගටම පවත්වනවට මමත් විරුද්ධයි මොකද අපි පොදු වෙළඳපොල ව්‍යාපාරිකයෝ ගැනත් බලන්න ඕන, ඒ වගේම සභාපතිතුමනි මට මිනිස්සු කියනවා මේ සති පොල සභාවේ පොලක් නෙවෙයි දුමින්ද මන්ත්‍රිතුමාගේ පොලක් කියලා. ඒත් මම කිව්වා ඒක එහෙම නෙවෙයි කියලා

ගරු මන්ත්‍රිතුමිය ඇත්තමට දුමින්ද මන්ත්‍රිතුමා තමා ලඟ ඉන්න කෙනා, ඒ නිසා මොනා හරි ගැටළුවක් ආවම මාත් එතුමාට තමා කෝල් කරලා බලන්න කියන්නේ, ඒ අනුව වෙන කිසිම සම්බන්ධකමක් එතුමාගේ නොමැති බවට ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

5. ගරු සභාපතිතුමාගේ පැහැදිලි කිරීම්.
    1. නළ ලිං භාවිතා කිරීම පිලිබඳව අපි සොයා බලා තීරනයක් ලබා දීමට කටයුතු කරනවා මොකද බොන වතුර ප්‍රමිතියක් තිබිය යුතු නිසාත්, ඒ පිළිබඳව අදාල ආයතන සමඟ සාකච්ඡා කර ඉදිරියේදී දැනුම් දීමට කටයුතු කරන්නම්.

(ක) මාසික අයවැය සටහන් හා කර්මාන්ත පිළිබඳ ප්‍රගති වාර්තා හා වෙනත් ලිපි

1. 2026 ජනවාරි හා පෙබරවාරි මසට අදාල ආදායම් වියදම් වාර්ථා.
2. 2026.02.28 දිනට ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය.
3. 2026 පෙබරවාරි 01 සිට මාර්තු 15 දක්වා ඉන්දන වාර්තාව

**සභාවේ නිමාව**

ගරු සභාපති ඩී.එස්.උයන්ගොඩ මැතිතුමා විසින් සභාවේ කටයුතු ප.ව 12.25 ට අවසන් කරන ලදි.

ඩී.එස්. උයන්ගොඩ
සභාපති
වත්තේගම නගර සභාව

........................................ දින පැවති මාසික මහා සභාවේ වාර්තාව සහා සම්මත කිරීම

සංශෝධන

.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................
..................................................

2026 ...................... මස........................වන දින පැවති, 2026 ...................මස මාසික මහා සභාවේ රැස්වීම් වාර්තාව ගරු නගර සභා උප සභාපති/ ගරු නගර සභා මන්ත්‍රී ............................................................................ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නගර සභා උප සභාපති/ ගරු නගර සභා මන්ත්‍රී ........................................................................ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් 2026 ................. මස ................ දින පැවති මහා සභාවේදී ඒකමතිකව සභා සම්මත කරන ලදි.

ඩී.එස්. උයන්ගොඩ
ගරු සභාපති
වත්තේගම නගර